**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ</u>**
**<u>ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන</u>**
**<u>බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.</u>**

**1. සම්බන්ධ වන ආයතන**

| | | |
|---|---|---|
| **1.1** දෙපාර්තමේන්තුව | :- | පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප)<br>යොමු අංකය :- එල්ජීඩී/02/21/03/69-1<br>දිනය :- 2014.12.15 |
| **1.2** අමාත්‍යාංශය | :- | පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)<br>යොමු අංකය :- CM/WP/ES/5/1-6<br>දිනය :- 2014/12/18 |
| **1.3** කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | :- | යොමු අංකය :- ඩීඑම්එස්/ඩී/පොදු/1[illegible]<br>දිනය :- 2012.12.19 |
| **1.4** ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය | :- | යොමු අංකය :- CSO/PTR/15/3/10<br>දිනය :- 2015-01-02 |
| **1.5** වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | :- | යොමු අංකය :-<br>දිනය :- |
| **1.6** බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | :- | යොමු අංකය :- 1/4/2/5/57<br>දිනය :- 2015.05.22 |
| **1.7** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | :- | යොමු අංකය :- 1/4/4/286<br>දිනය :- 2015.06.09 |

**2. පත් කිරීම් බලධාරියා** :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

**3.1** සේවා ගණය :- ආශ්‍රිත නිලධාරි.

**3.2** ශ්‍රේණි :- III, II, I ශ්‍රේණි වලින් සමන්විතයි.

**3.3** පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :-

පළාත් පාලන ආයතනවල මූලික නීතීන් හා වෙනත් අණපනත් වලින් පැවරී ඇති පරිදි ප්‍රජා අවශ්‍යතාවයන් සඳහා ප්‍රජාව ඒකරාශී කිරීම වැනි කාර්යයන් පැවරෙන, බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් අධ්‍යාපන සුදුසුකම ලෙස අවශ්‍ය වන්නා වූ සේවා ගණයකි.

**3.4** කාර්යයන් පැවරීම :- ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

අනුමත කරමි / ~~නොකරමි~~

දිනය 2015.06.9

ජෝ.සී. ලොගේස්වරන්
ආණ්ඩුකාරවර
බස්නාහිර පළාත

**4. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :-** ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

**5. වැටුප්**

**5.1** වැටුප් කේත අංකය :- MN 4 – 2006A

**5.2** වැටුප් පරිමාණය :- රු.15,215-10x 215-4x240-7x320-15x360-25,965/-

**5.3** ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 1 | 15,215/- |
| II | පියවර 12 | 17,605/- |
| I | පියවර 23 | 20,925/- |

**6.** සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

**6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-**

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ප්‍රජා සංවර්ධන නිලධාරි | III,II,I ශ්‍රේණි | 47 | • පළාත් පාලන ආයතන හා පළාත් පාලන දෙපාර්තමේන්තුව අතර මනා අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම.<br>• පළාත් පාලන බල ප්‍රදේශය තුළ ප්‍රජා මණ්ඩල පිහිටුවීම හා ක්‍රියාකාරීව පවත්වාගෙන යාම හා පළාත් පාලන ආයතනයේ කාර්යයන් සඳහා ප්‍රජා මණ්ඩල සහාය ලබා ගැනීම.<br>• පොදු මංමාවත්, මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා හා අනෙකුත් ප්‍රජා වැඩ කටයුතුවලට අදාළ කාර්යයන් සම්බන්ධව අධීක්ෂණය.<br>• එම කටයුතුවලදී ආයතනික මට්ටමේ දී, කාර්යාල මට්ටමේ දී හා බිම් මට්ටමේ දී ක්‍රියාත්මක කිරීමේ නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම.<br>• පෙර පාසල් හා පුස්තකාල අධීක්ෂණය, මග පෙන්වීම, උපදෙස් දීම හා පහසුකම් සලසා දීම හා එම කටයුතු ප්‍රවර්ධනය කිරීම.<br>• සමස්ත ප්‍රජා සංවර්ධන කාර්යයන් සම්බන්ධව අධීක්ෂණය, සම්බන්ධීකරණය, වැඩ සටහන් සකස් කිරීම හා වැඩ සටහන් හඳුන්වා දීම.<br>• පරිසර සංරක්ෂණය හා කසළ කළමනාකරණය පිළිබඳව කටයුතු කිරීම. |

**6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව** :- 47 යි.

(ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III,II,I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/286 දිනය : 2015/06/09

## 7. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :- විශ්ව විද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව හෝ ජනසන්නිවේදනය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

විශ්ව විද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව හෝ ජනසන්නිවේදනය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් ව ඇති උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත.

7.2.2.3 පළපුරුද්ද :- අදාළ නැත

7.2.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iv. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 21ට නොඅඩු විය යුතුය.

7.2.3.2 උපරිම සීමාව :- අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40% |
| අභියෝගතා පරීක්ෂණය | 100 | 40% |

සටහන :- ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙළ අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

(ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය - ඇමුණුම අංක 01.)

7.2.4.1.1 පවත්වන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ
එහි බලය පවරනු ලබන ආයතනයක් මගින්.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.2.1 පවත්වන බලධරයා :- අදාළ නැත

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :- මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- පත්වීම් බලධරයා විසින්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ නැත

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 සීමිත බඳවා ගැනීම** :- අදාළ නැත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

**7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම** :- අදාළ නැත.

## 8. කාර්යක්ෂමතා කඩඉම

**8.1**

| **කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග** | **කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද** | **කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්** |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 04) |

**8.2** කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

**8.3** කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? :-

1 වන කාර්යක්ෂමතා කඩඉම<br>
2 වන කාර්යක්ෂමතා කඩඉම<br>
3 වන කාර්යක්ෂමතා කඩඉම

} බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පවරනු ලබන ආයතනයක් මගින්.

## 9. භාෂා ප්‍රවීණතාවය

**9.1**

| **භාෂාව** | **ලබාගත යුතු ප්‍රවීණතාවය** |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.01/2014 චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාළ නැත. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

**10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.**

10.1.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

i. පත්වීම ස්ථිර කර තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/28 දිනය : 2015/06/09

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) තුළ ම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 05) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව, III ශ්‍රේණියේ වසර දහය(10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

## 10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළ ම සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 05) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව, II ශ්‍රේණියේ වසර දහය(10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

**10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම :-** අදාළ නැත.

**11. තනතුරු වලට පත් කිරීම :-** අදාළ නැත.

**12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :-**

III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය

මෙම පරිපාටිය අනුමත වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව MN 4 වැටුප් කේතය යටතේ බඳවා ගෙන ඇති, ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරේ වසර 10ක සේවා කාලයක් සපුරා නොමැති නිලධාරීන් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට ප්‍රජා සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

සටහන

- අන්තර්ග්‍රහණයෙන් අනතුරුව අදාළ ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
- දැනටමත් III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් නව ව්‍යවස්ථාවට අනුව අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වූවා සේ සලකා කටයුතු කෙරෙනු ඇත.
- අන්තර්ග්‍රහණය කරන දිනට අන්තර්ග්‍රහණය කරන තනතුරට පත්වීමට අවශ්‍ය සේවා කාලයට වඩා වැඩිපුර සේවය කර ඇති කාලය ඊළඟ ඉහළ තනතුරට උසස් කිරීමේදී අවශ්‍ය සේවා කාලය සඳහා සලකා බලනු ලැබේ.
- අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට අනුව සිදු කරනු ලබන අතර, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ සේවකයින්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවන අතර, වැටුප් පරිවර්තනයේ දී අදාළ සේවකයා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

**15.** මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

**16.** අර්ථ නිරූපණ

<u>සතුටුදායක සේවා කාලය :</u>

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්‍ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්‍ෂමතා කඩඉම් සමත් වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයා ගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

<u>සක්‍රීය සේවා කාලය :</u>

'සක්‍රීය සේවා කාලය' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

<u>නියමිත දිනට :</u>

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධරයින්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධරයින්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | : .................................. | පරික්ෂා කළේ | : .................................. |
| නම | : ජී. කේ. සී. එම්. මෛත්‍රීරත්න | නම | : [illegible] |
| තනතුර | : පරිපාලන නිලධාරිනී | තනතුර | : [illegible] (ඩැ. බ) |
| දිනය | : [illegible] පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) | දිනය | : පළාත් පාලන [illegible] බස්නාහිර පළාත 2014/12/10 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්

තනතුර : පළාත් පාලන කොමසාරිස්

දිනය : .......බස්නාහිර පළාත.

12/5

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ගොනු අංකය : 1/4/4/228 දිනය : 2015/06/09

---

යොමු අංකය : CM/WP/E15/5/1-6

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........

අමාත්‍යාංශ ලේකම්(බ.ප)

දිනය : 2014/12/18

නිල මුද්‍රාව: එම්. ... සෙනරත්, අධ්‍යාපන, ... රැකීරක්ෂා සහ ප්‍රවාහන ... "ශ්‍රාවස්ති ..." 32, ශ්‍රීමත් මාකස් ... මාවත, කොළඹ 07.

---

යොමු අංකය : CSO/PTR/15/3/10

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........

ප්‍රධාන ලේකම්(බ.ප)

දිනය : 2015-01-02

නිල මුද්‍රාව: ජේ. එම්. සී. ජයන්ති විජේතුංග, ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

---

යොමු අංකය : 1/4/2/5/57

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

දිනය : 2015. 05. 22

නිල මුද්‍රාව: වී. රාජපක්ෂ, ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), 532/7, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ - 05.

---

යොමු අංකය : 1/4/4/286

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2015/06/09 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........

ආණ්ඩුකාර ලේකම්(බ.ප)

දිනය : 2015/06/09

නිල මුද්‍රාව: සුනිල් අබේවර්ධන, බ.ප. ආණ්ඩුකාර ලේකම්, බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, 98/4, හැව්ලොක් පාර, කොළඹ 05.

---

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

ඇමුණුම 01.

**<u>පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ</u>**
**<u>ප්‍රජා සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය.</u>**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ප්‍රජා සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය.

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 % |
| අභියෝගතා පරීක්ෂණය | පැය 01 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පවරනු ලබන ආයතනයක් මගින්.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන් ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| අභියෝගතා පරීක්ෂණය | අපේක්ෂකයන්ගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |

අත්සන : H S
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත.
දිනය : 12/15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286. දිනය : 2015/06/09

ඇමුණුම 02

**පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ**
**ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරෙහි I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)
2. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| පළාත් පාලන අණපනත් හා පළාත් සභාවේ මූල්‍ය රීති | පැය 01 විනාඩි 30 | 100 | 40 % |
| විෂයානුබද්ධ දැනුම | පැය 01විනාඩි 30 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පවරනු ලබන ආයතනයක් මගින්.
4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.
5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පළාත් පාලන අණපනත් හා පළාත් සභාවේ මූල්‍ය රීති | • මහා නගර සභා, නගර සභා ආඥා පනත, ප්‍රාදේශීය සභා පනතේ මහජන උපයෝගීතා සේවා, මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාළ විධි විධාන.<br>• මහා නගර සභා, නගර සභා ආඥා පනත, ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන පරිදි සම්මත කර ක්‍රියාත්මක කරනු ලබන අතුරු ව්‍යවස්ථා හා නව ව්‍යවස්ථා සම්පාදනය.<br>• පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ<br>I පරිච්ඡේදයේ 1,2,3 කොටස්<br>II පරිච්ඡේදයේ 1 කොටස<br>IV පරිච්ඡේදයේ 2 කොටස<br>V පරිච්ඡේදයේ 1,2,3,4 කොටස් සම්බන්ධ දැනුම. |
| විෂයානුබද්ධ දැනුම | • ප්‍රජා සංවර්ධනය හා එහි සමස්ත අරමුණු.<br>• ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන වැඩ සටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති පාලනය.<br>• තොරතුරු රැස් කිරීම, දත්ත විශ්ලේෂණය හා විවිධ වැඩ සටහන් විමර්ශනය.<br>• ප්‍රජා අවශ්‍යතා සපුරාලීම සඳහා මහජන පුස්තකාල, ආයුර්වේද බෙහෙත් ශාලා, ළදරු පාසල්, මාතෘ හා ළදරු සායන මධ්‍යස්ථාන, වෙනත් විවිධ ග්‍රාමීය ආයතන උපයෝගී කර ගැනීම.<br>• පරිසර සංරක්ෂණය හා කළමනාකරණය.<br>• ප්‍රජා මණ්ඩල පිහිටුවීම, වැඩි දියුණු කිරීම හා ප්‍රජාව වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |

අත්සන : .......(signature).......
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත
12/15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

ඇමුණුම 03

**පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ**

**ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)**

1 විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරෙහි II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2 විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන කාර්ය පරිපාටි හා පළාත් සභාවේ මූල්‍ය රීති | පැය 01 විනාඩි 30 | 100 | 40 % |
| විෂයානුබද්ධ දැනුම | පැය 01 විනාඩි 30 | 100 | 40 % |

3 පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පවරනු ලබන ආයතනයක් මගින්.

4 පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5 විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පරිපාටි හා පළාත් සභාවේ මූල්‍ය රීති | • කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ IX, XII, XIII, XIV, XVII පරිච්ඡේද සම්බන්ධ දැනුම.<br>• පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ<br>I පරිච්ඡේදයේ 4,5 කොටස්.<br>II පරිච්ඡේදයේ 2,3 කොටස්.<br>VI පරිච්ඡේදයේ 1,2,3 කොටස්.<br>VII පරිච්ඡේදයේ 1,2,4 කොටස් සම්බන්ධ දැනුම. |
| විෂයානුබද්ධ දැනුම | • ප්‍රාදේශීය සැලසුම්කරණය හා මූලධර්ම හා ගැටළු.<br>• තොරතුරු රැස් කිරීම හා දත්ත විශ්ලේෂණය හා විවිධ වැඩසටහන් විමර්ශනය.<br>• ප්‍රජා සංවර්ධනයේ සමස්ත අරමුණු හා සංකල්ප.<br>• සහභාගීත්ව සංවර්ධනය හා උපාය මාර්ග.<br>• සමෘද්ධිය හා විවිධ සමාජ සංරක්ෂණ වැඩ සටහන් අරමුණු හා ක්‍රියාකාරීත්වය.<br>• පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත පවරා ඇති බලතල හා ඒවා ක්‍රියාවට නැංවීම. |

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත.

12/15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

**ඇමුණුම 04**

**පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ**
**ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)**

1 විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරෙහි III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ලිඛිත).

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන කාර්ය පරිපාටිය හා බස්නාහිර පළාතේ මූල්‍ය රීති | පැය 01 විනාඩි 30 | 100 | 40 % |
| විෂයානුබද්ධ දැනුම | පැය 01 විනාඩි 30 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි බලය පවරනු ලබන ආයතනයක් මගින්.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පරිපාටිය හා බස්නාහිර පළාතේ මූල්‍ය රීති | • කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ VII, VIII, XIV, XV, XXIII, XXXII පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ II, කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේද සම්බන්ධ දැනුම.<br>• පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ<br>III පරිච්ඡේදය.<br>V පරිච්ඡේදයේ 5,6 කොටස්,<br>VI පරිච්ඡේදයේ 4,5 කොටස්<br>VIII පරිච්ඡේදයේ අත්තිකාරම් ගිණුම්,<br>X පරිච්ඡේදයේ 1,2,3,4,5 කොටස් සම්බන්ධ දැනුම. |
| විෂයානුබද්ධ දැනුම | • විවිධ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම.<br>• ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති පාලනය.<br>• ග්‍රාමෝදය මණ්ඩල, ප්‍රජා මණ්ඩල වෙනත් විවිධ ස්වේච්ඡා සංවිධාන සංස්ථාපනය, ක්‍රියාකාරීත්වය හා එම සංවිධාන ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රජා සංවිධාන වශයෙන් උපයෝගී කර ගැනීම.<br>• ජාතික පාරිසරික පනත, අරමුණු බලතල හා ක්‍රියාකාරීත්වය.<br>• දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිසර කමිටු අරමුණු හා ක්‍රියාකාරීත්වය.<br>• සාහිත්‍ය හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය හා සාහිත්‍ය මාසය වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවන්.<br>• රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සංවර්ධනය සම්බන්ධයෙන් ඒවායෙහි ඇති වැදගත්කම. |

අත්සන : ...............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ......චන්ද්‍රානි සමරකෝන්
තනතුර : ......පළාත් පාලන කොමසාරිස්
දිනය : ............බස්නාහිර පළාත.
12/15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/38.6 දිනය : 2015/06/09

ඇමුණුම 05.

<u>ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරෙහි ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය</u>

**1. නිලධාරියා පිළිබඳ තොරතුරු.**

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................................

1.2 හැඳුනුම්පත් අංකය : ..................................................................................

1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : ..................................................................................

1.4 අයත් වන සේවය හා තනතුර : ..................................................................................

1.5 අයත් වන සේවා ගණය හා ශ්‍රේණිය : ..................................................................................

**2. පත්වීම පිළිබඳ තොරතුරු**

2.1 පත්වීම් දිනය : ..................................................................................

2.2 පත්වීම් ස්ථිර කළ දිනය : ..................................................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය:

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය:

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

**3. උසස් වීමට අදාළ තොරතුරු**

3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II/I

3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? ඔව්/නැත.

3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..........................................................................

3.2.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේ ද? ඔව්/නැත.

3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේ ද? ඔව්/නැත.

උසස් වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද? ඔව්/නැත.

3.2.5 විනය දඬුවම් ලබා තිබේ ද? ඔව්/නැත.

**4. අයදුම්කරුගේ ප්‍රකාශය.**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ 11/1 ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

................................................

දිනය නිලධරයාගේ අත්සන.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09

**5. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් .............................................. මහතා/මහත්මිය/මෙනෙවිය ........................................................සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

| | |
|---|---|
| නම | : ......................................... |
| අත්සන | : ......................................... |
| දිනය | : ......................................... |
| නිල මුද්‍රාව | : ......................................... |

**6. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත්/ නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත්/නොවන බවත්, කාරුණිකව දන්වමි.

| | |
|---|---|
| නම | : ......................................... |
| අත්සන | : ......................................... |
| දිනය | : ......................................... |
| නිල මුද්‍රාව | : ......................................... |

**7. ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ............................................................................................ මහතා/මහත්මිය/මෙනෙවිය ........................................................ සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම නිර්දේශ කරමි.

| | |
|---|---|
| නම | : ......................................... |
| අත්සන | : ......................................... |
| දිනය | : ......................................... |
| නිල මුද්‍රාව | : ......................................... |

**8. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්/පත්වීම් බලධරයා.**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ........................................ මහතා/ මහත්මිය/මෙනවිය ....................... සේවා ගණයේ ..........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ ....................................... දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| නම | : ......................................... |
| අත්සන | : ......................................... |
| දිනය | : ......................................... |
| නිල මුද්‍රාව | : ......................................... |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/286 දිනය : 2015/06/09